# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2 ශ්‍රේණිය -බුද්ධ ධර්මය - නොවැම්බර මාසය - 3 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය.

M.A.R.P.කුමාරි - ර/රත්මලවත්ත මහා විද්‍යාලය

## 22 - පාඩම ආදරයෙන් පරිසරය රැක ගමු.

පරිසරය මා රකී. රකිමි මම පරිසරය. ලෝකයට බර නොවී වැඩ පිණිස මම හැදෙමි. වාසනාවන්ත වූ අනාගතයක් කරා පාසලින් මග දකින හොඳම දරුවා මමයි..........

පුතාලා අහලා තියෙනවා නේද ඒ ගීතය.පරිසරය මා රකී,රකිමි මම පරිසරය කියන්නේ කියන්නේ මොකක්ද දන්නව ද ?මේ පරිසරය ඇළ,දොළ,ගංගා,ගස් වැල් සතුන් නැතිව අපිට ජීවිතයක් නෑ කියන එක.

බලන්න දුවේ පුතේ අපේ මේ නහය කට වසාගෙන අපිට ඉන්නා පුලුවන්ද කියලා.හරිම අපහසුයි.අපිට හුස්ම ගන්නා පිරිසිදු වාතය,ආහාරයට ගන්න රසවත් පලතුරු,එළවලු ආහාර,ජලය ලබා දෙන්නේ මේ පරිසරයයි.

ඉතිං දුවේ පුතේ අපි මේ පරිසරයට ආදරයෙන් සලකමු.එතකොට පරිසරය අපිවත් ආදරයෙන් රැක බලා ගනී.

පරිසරය රැකගන්න මොනවද අපිට කරන්න පුලුවන් ? හොඳ දේ සඳහා (✓) ලකුණද හොඳ නැති දේ සඳහා (✕) ලකුණද යොදමු.

1.ගස් සිටුවීම. ( )

2.මල් පැළ සිටුවා රැක බලා ගැනීම. ( )

3.දිරන නොදිරන දේ වෙන්කර කුණු බැහැර කිරීම. ( )

4.තැන් තැන් වල කෙළ ගැසීම. ( )

5.සතුන්ට ආහාර සහ ජලය ලබා දීම ( )

6.කුරුලු කූඩු විනාශ කිරීම. ( )

7.ජලය ලබා ගන්නා තැන් වලට කුණු දැමීම. ( )

8.පාර අතු ගා පිරිසිදු කිරීම. ( )

මේ දිනවල දෙමව්පියන්ගේ උදව් ඇතිව සතුන්ට කෑම හා වතුර දීමට කුරුළු ලෑල්ලක් සකස් කර ගනිමු. කුරුල්ලන් හා සතුන් කෑම කා සතුටු වන ආකාරය බලා ඉදිමු. අපිත් සතුටින් කාලය ගත කරමු.

මේ පාඩමට අදාළ වීඩියෝ පාඩම නැරඹීම සඳහ youtube එකට ගොස් Renuka Kumari ආදරයෙන් පරිසරය රැක ගමු ලෙස Type කරන්න.

**"හොදයි ආදරණීය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!"**